

සනත් පියසේන

19

# කොකිස් හොරා අවුරුදු කයි

**අ**ප හැම දෙනාම බොහෝම ආශාවෙන් බලාපොරොත්තුව සිටින උත්සවය සිංහල අලුත් අවුරුදු උත්සවය යි. අවුරුද්ද කිට්ටු වන විට ගමට දැනෙන අලුත් අවුරුදු ජීවය ක්‍රමයෙන් මෝරා යන්නේ ගෙවල් දොරවල් පිරිසිදු වීමෙන්, බිම ගොම මැටි ගෑවී අලුත්වීමෙන්, වත්ත පිටිය උදළුගෑවී කලඑළිවීමෙන්, කැවුම්, කොකිස්, අතිරස, ආස්මී, අලුවා ආදී නොයෙකුත් කැවිලි පෙවිලි සකස්වීමෙන්, කෙසෙල් කැන් ඉදීමෙන් ආදියෙන් ය. අප්‍රියෙල් මාසයට මාස දෙක තුනකට කලින් පළගන්නා සෑම කෙසෙල් කැනකම හිමිකම ලබන්නේ සිංහල අලුත් අවුරුද්ද යි. කොහාගේ මියුරු නාදයත්, වහලේ එල්ලෙන කෝඳුරු කරල් කීපයත් අවුරුද්ද අතළඟ බව සවනට මෙන්ම නෙතට දක්වන සන්නිවේදනය අප හැම දෙනාට අත් කරන්නේ අවුරුදු කිතියකි.

මාස දෙක තුනක සිට ම අප කැටවලට සල්ලි එකතු කරන්නේ කැට ගැසීමට ය. අවුරුදු කිට්ටුව කැවිලි සෑදීම සඳහා පිටි කොටන ශබ්දයේ රිද්මය නිවසින් නිවසට තරඟකාරී ස්වරූපයක් උසුලයි. කොතරම් අගහිඟකම් තිබුණත් "අවුරුදු කෑම නොකාම බැරි" කෑමකි. අපේ ආතාද අවුරුද්ද කිට්ටුවන විට පොල් අරක්කු බෝතල් දෙකක් කළුතර යන කාට හරි රුපියල් අටක් දී ගෙන්වා ගෙන අල්මාරියේ යට ම තට්ටුවේ රෙදි වලට යටින් තියයි. එය පාවිච්චියට ගැනීමට බලාපොරොත්තු වන්නේ අවුරුදු දිනයන්හි දී වුවත්, අවුරුද්ද ලබන විට බෝතලයක් හමාරක් ඉවර වන්නේ ආතා ද නො දැනුවත්ව ම ය. ආතා හැන්දෑවට හැන්දෑවට ඩිංග ඩිංග වත්කරගෙන උගුරට හලාගෙන කට පිස දමමින් එළියට එනවා අප නොයෙක් වර දැක ඇත.

අවුරුදු දාට කලින් දා හැන්දෑවේ ආතා එළියේ ඇඳේ නිදා සිටින විට පාරේ යන හිතවත් කාට හෝ කතා කර ඔහු ගෙය ඇතුළට කැඳවාගෙන ගොස් පුංචි විදුරුවක්, බෝතලයත් සමග ම ඉහළට ඔසවා වීදුරුවෙන් බාගයක් පමණ අරක්කුවලින් පුරවා දෙන්නේ මහත් ම වූ ළෙන්ගතුකමකිනි. ඔහුද එය දෝතින් ම ගෙන, එයට විරිත්තා කට බලියා උගුරට හලාගෙන, අපට අප්පිරියා හිතෙන තරමට මූණ බෙරිකොට කාරා, මිදුලට කෙළ ගසා, අප කාට හරි කියා අටුකොස් ඇටයක් දෙකක් ගෙන්වා ගෙන හපහපා අපේ ගෙදර සියල්ලනට ම අවුරුදු ගණනාවකට සුභ පතා පිටත්ව යයි.

අවුරුද්දට අලුත් ඇඳුම් ගෙන එන්නේ රෙදි පොට්ටනියක් හිස මත තබාගෙන වෙළඳාමේ එන චීන මුදලාලිලා ය. තරමක පෙට්ටියක ප්‍රමාණයට රෙදි පොට්ටනියක් කර මත තබාගෙන මිනුම් දණ්ඩක් සුරතේ දරාගෙන, හිසේ සුදුපාට තොප්පියක් පැළඳි "චීයැප්"යන ශබ්දයෙන් අපට නොතේරෙන වචනයක් ශබ්ද කරමින් චීන මුදලාලිලා කීප දෙනෙක් ම අවුරුදු කිට්ටුව ගමට පැමිණ රෙදි විකුණනවා දැක පුරුදු ය. එසේ ම මාල, වළලු, මුදු, කරාබු ආදිය මෙන් ම, පුංචි නළා වර්ග, බැලුම් බෝල, හුළංපෙති ආදිය රැගෙන එන මුස්ලිම් වෙළෙන්දන් පිරිසද අප නෙතට සිතට දනවන්නේ ආනන්දයකි.

අප කැට ගැසීමට පටන්ගන්නේ ද අවුරුද්දට දින දෙක තුනකට කලින් සිට ම ය. අපේ ගෙදර පොඩි කට්ටිය, ප්‍රේමතිලක බාප්පලාගෙ ගෙදර කට්ටිය, සහ පියතිලක බාප්පලාගේ ගෙදර කට්ටිය කීප කීප දෙනා බිම වාඩි වී සතේට සතේ කැට ගසන්නෙමු. මෙසේ කැට ගසන අතරවාරයේ පොඩි අප අතර සණ්ඩු සරුවල් ඇතිවන අවස්ථාද නැතුවා නොවේ.

අපේ ආච්චීද අවුරුදුවලට කැවුම්, කොකිස්, අලුවා ආදී කැවිලි වර්ග කීපයක් හදන්නී ය. පිටි කෙටීම අලුවා කැපීම, කැවුම් ඉවීම ආදී වැඩ කටයුතු ගෙයින් ගෙයට යමින් එකිනෙකාට උදපදව් හුවමාරු කරගනිමින් ඉටුකර ගන්නා ආකාරය ගැමි දිවියේ ඇති අන්‍යෝන්‍ය සුහදතාවය මනාව පෙන්වන කැඩපතකි. නොනගතය ලබන වේලාව, ළිප ගිනි මොළවන වේලාව, වැඩ අල්ලන වේලාව, අනුභව කරන වේලාව, හිසතෙල් ගාන වේලාව ඇපා ලිතෙන් බලා ගන්නේ බිත්ති ලිතක් අලවා තිබෙන නිවසකට ගොස් ය. මුළු ගමට ම ලිත් දෙක තුනකට වඩා නැත. ඒ ඒ වේලාවන් බොහෝ සෙයින් එකිනෙකාගෙන් අසා දැන ගන්නා අවස්ථාවන් සුලබ ය.

නොනගතය ලැබූ වේලාවේ සිට කිසිවෙකුට කිසිවක් නොදීමටත්, කිසිවක් කිසිවෙකුගෙන් නොගැනීමටත් සියලු ම වැඩිහිටි පිරිස බොහෝ උවමනාවෙන් වග බලා ගනිති. දරුවකුගේ අතින්වත් කිසිවක් නො ගන්නා අතර දරුවකුගේ අතටවත් කිසිවක් නො දෙති. අතට නො දුන්නත් අරගැනීම පිණිස ලබන්නාගේ කිට්ටුවෙන්

> *නිවසේදී මෙසේ වුවත්, බූරු පොළේ දී, කැට පොළේදී, හෝ සයිඩර් පොළේදී මෙම නීති රීති කිසිවක් බල නොපාන බව පෙනේ. කැටපොළේදී මුදල් හදල් මෙන්ම වළං පිඟන්, සබන්, පවුඩර් ටින් වැනි නොයෙකුත් දේ ගනු දෙනු වුවත්, කැටපළෙන් පසු ගෙදරට පැමිණ නැවතත් චාරිත්‍ර වාරිත්‍ර අකුරට ම පිළිපදින බව පෙනේ.*

තැබීමෙන් වරදක් නොවන බව සිතති. නොනගතය වේලාවට යමක් කෙනෙකුට දීමට අවශ්‍යවේ නම් එය ඔහුට පෙනෙන්නට කිසියම් තැනක තබති. ඒ ආකාරයෙන් මුදල් පවා ගනුදෙනු කරන අවස්ථාවන් අප දැක ඇත.

නිවසේදී මෙසේ වුවත්, බූරු පොළේ දී, කැට පොළේදී, හෝ සයිඩර් පොළේදී මෙම නීති රීති කිසිවක් බල නොපාන බව පෙනේ. කැටපොළේදී මුදල් හදල් මෙන්ම වළං පිඟන්, සබන්, පවුඩර් ටින් වැනි නොයෙකුත් දේ ගනු දෙනු වුවත්, කැටපළෙන් පසු ගෙදරට පැමිණ නැවතත් චාරිත්‍ර වාරිත්‍ර අකුරට ම පිළිපදින බව පෙනේ.

නොනගතයට දරුමල්ලන්ද කැටුව පන්සල් යාම බවලත් උදවිය නොවරදවා ම කරන ක්‍රියාවකි. අලුතෙන් මහන ලද ඇඳුම් එළියට එන්නේ අවුරුදු දා එළිවනවිට ම වාගේ ය. මල්, පොල්තෙල්, හඳුන්කූරු, ආදිය රැගෙන පන්සල් යන පිරිස වැළ නොකැඩී යයි. පාර අයිනේ ඇති කඩ, එක දොර ලෑල්ලක් පමණක් ඇරගෙන සිටින්නේ පොල්තෙල්, හඳුන්කූරු සහ අවශ්‍ය වුවහොත් වළංද විකිණීමට ය. මුදලාලිලා ද මුදල් ගැනීමේ දී මුදල් අතට නො ගනී. මුදල් තැබීමට වෙනත් තැනක් පෙන්වයි. ඉතිරි මුදල් දීමේ දී ද අතට නොදී වෙනත් තැනකින් තැබීමටද වග බලා ගනිති. පන්සලට යන පිරිසද මල්ටිකක්, හඳුන්කූරක්, පහන්තිරයක් හෝ පොල්තෙල් බෝතලයවත් අතින් අතට කෙළින් ම මාරු නොවීමට තරම් කල්පනාකාරී වෙති. කොතරම් පිපාසය සැදුණත් මගදී වෙනත් නිවසකින් වතුර ටිකක් වත් ඉල්ලා ගැනීමට නොපෙළඹෙන්නේ නිවසකින් එදිනට එවැන්නක් හෝ නො ලැබෙන බැවිනි. එහෙත් කිසියම් ගෙමිදුලක අවශ්‍ය කෙනෙකුට පානය කිරීම සඳහා වතුර කළගෙඩියක් සහ වීදුරුවක් පාර අයිනේ තබා තිබෙනවා අප දැක ඇත.

නොනගතය වේලාවට නිවසේදී තේ බීමට අවශ්‍යතාවක් ඇතිවුවහොත් එළියේ ළිපක් බැඳ වතුර උණු කරගෙන තේ සාදා බොන අවස්ථාවන්ද නැතුවා නොවේ. එ මෙන් ම කලින් සාදන ලද කැවුම් කොකිස් ආදිය ද, කෙසෙල් ගෙඩිද පුංචි අප කෑමට ගන්නා අවස්ථාවන් බොහෝ ය. සමහර විට කොකිස් පෙති කිහිපයක් ඔඩොක්කුවේ දමාගෙන සිටින වේලාවල් ද පොඩි අප අතර තිබේ. චාරිත්‍ර වාරිත්‍ර රැකීම බෙහෙවින් ම අගය කරන ගමේ පිරිස අවස්ථානුකූලව යොදා ගතහැකි මෙවන් "අහිංසක ප්‍රයෝග" කොතෙකුත් ඇත.

එවකට දැන් වාගේ නැකැත් වේලාව හරියට ම කියන්නට රූපවාහිනී හෝ ගුවන් විදුලි යන්ත්‍ර තිබුණේ නැත. තත්පරයෙන් තත්පරයට අවරෝහණ ක්‍රමයට ළිපගිනි මොළවන වේලාව හෝ අනුභව කරන වේලාව ගුවන් විදුලියෙන් කීවා දැයි නොදනිමි. එමෙන් ම අද මෙන් සෑම නිවසකම ගුවන් විදුලි යන්ත්‍ර නො තිබුණා මෙන් ම, සෑම නිවසක ම ඔරලෝසු ද තිබුණේ නැත. එකවිට ම නොනැවතී ඇසෙන රතිඤ්ඤා ශබ්දය නැකැත් වේලාව දැන ගැනීමට මහෝපකාරී වෙයි.

කිරිබත ඉදී අවසන් වූ පසු කොස් ගසකින් අතු කැබැල්ලක් කපාගෙන එන ආච්චි එම අත්ත අපේ ගේ ඉදිරිපිට ඇති ඇඹුල් දොඩම් ගසේ අතේ උස හරියෙන් බඳියි. ඒ අසලින් ම කැත්තද ගෙනැවිත් තබයි. එසේ සකස් කරන්නේ වැඩ ඇල්ලීම සඳහා ය. ආහාර අනුභව කරන වේලාවට ආච්චි මුලින් ම කරන්නේ නිවසේ හැම කෙනෙකු සඳහා ම පිඟාන බැගින් තබා ඒවාට කිරිබත් බෙදීම ය. ඉන්පසු ගෙදර සෑම කෙනෙකුටම පිඟානෙන් කිරිබත් පිඩ බැගින් කවමින් ම පිඟාන අතට දෙන්නී ය. අනුභව කරන වේලාවට මාමා හෝ ආතා ගෙදර ඉන්නවා මා දැක නැත. සූදු ක්‍රීඩාව ද අවුරුද්දේ එක අංගයක් වශයෙන් සැලකූ ගමේ සමහර පිරිමි ගජරාමෙට බූරුවා ගසන බැවින් ආතාට ද මාමාට ද නැකතට අනුභව කරන්නට වේලාවක් නොතිබෙන්නට ඇත.

අප සැම අතට කිරිබත් පිඟාන දුන් පසුව ආච්චි ඇඹුල් දොඩම් ගස ළඟට ගොස් කැත්ත අතට ගෙන කොස් අත්තෙන් කැබැල්ලක් කපා දමා නැවත ගෙට පැමිණ මහන මැෂිම ළඟට ගොස් කුමක් හෝ රෙදි කැබැල්ලක මැහුම් පාරක් ගසන්නී ය. නැවත කුස්සියට දුවගෙන ගොසින් කලින් වෙන් කොට තැබූ සතයේ කාසියක්, ගිය අවුරුද්දේ නැකත් වේලාවට ළිඳෙන් ගෙනා වතුර පිරවූ බෝතලය ද, අඟුරු කැබැලි කිහිපයක් සහ පොඩි තුනපහේ පොට්ටනියක් එක අතකට රැගෙන කළය ඉනට ගෙන උඩහ කඩයේ ළිඳ වෙත දුවන්නී ය. (අවුරුද්දට ළිඳෙන් වතුර ගෙන එන බෝතලය නිවසෙහි පැවතුණු අය වැය පිළිබඳ සංකේතාත්මකව දක්වන කැඩපතක් ලෙස ගැමියෝ අදහති.) ළිඳ සමග ගනුදෙනු කොට නිවසට පැමිණ සැමටම කැවිලි බෙදා තේ සාදා දී අනුභවයේ චාරිත්‍රය අවසාන කරන්නී ය.

(ලබන කලාපයට)

4 වන පිටුවෙන් (මේ ද්‍රෝහියාට )

සංස්ථාව විසින් දිනකට විකුණානු ලබන බව පෙන්වා ඒ ප්‍රමාණයට සංස්ථාවට ඉන්ධන එතෙරින් ගෙන්වීමට සිදුවන බවයි. ඉන්දියානු සමාගම ද මෙරට ඉන්ධන වෙළෙඳාමේ සිටින බවක් සභාපතිවරයා පැවැසුවේ නැත. මේ සියල්ලම දෙස බලන විට වැඩි මිලට මෙතරම් ඉන්ධන තොගයක් මෙරටට ගෙන්වූයේ වෙන කිසිවක් නිසා නොව වැඩි මිලට වැඩි කොමිස් ලැබෙන නිසාය. එසේම දීර්ඝ කාලීන ගිවිසුම්වලට යන විට විශේෂ කොමිස් මුදලක් ද ලැබෙන්නේය.

ඉන්දීය තෙල් සමාගම ඉන්ධන මිලදී ගන්නේ සති දෙකෙන් දෙකට මිල ගණන් කැඳවීම් තුළිනි. ලෝක වෙළෙඳ පොළේ එදිනෙදා පවතින මිලට ඉන්ධන මිලදී ගැනීමේ එම පිළිවෙත නිසා එම සමාගම මේ වනවිට ඉන්ධන අලෙවියෙන් විශාල ලාභයක් උපයාගෙන තිබේ. ඔවුන් ඉන්ධන ලීටරයකින් ලබන ලාභය රුපියල් 25-30 ත් අතර මුදලකි.

මෙවන් තත්ත්වයක් තිබියදී සංස්ථා සභාපතිවරයා වැඩි මිලට අවශ්‍ය ප්‍රමාණයට වඩා ඉන්ධන තොග ගෙන්වීම නිසා මේ වන විට ඉන්ධන ගබඩා කර ගැනීමේ පහසුකම ද අවහිරව ගොස් තිබේ. මුතුරාජවෙල ගබඩාවලින් දිනකට ඉන්ධන මෙට්‍රික් ටොන් 2000 ක් බෙදාහැරිය යුතු වුවත්, අද එතැනින් දිනකට බෙදාහරින උපරිමය මෙට්‍රික් ටොන් 900 කි. මේ අනුව තව සතියකින් පමණ මෙරටට ලඟාවීමට නියමිත කොරියානු සමාග මේ ගිවිසුම අනුව ගෙන්වන ඉන්ධන මෙට්‍රික්ටොන් ලක්ෂය ගබඩා කර ගැනීම සඳහා මුතුරාජවෙල ගබඩාවේ ප්‍රමාණවත් ඉඩ පහසුවක් නැති වීම නිසා ඉන්ධන ගබඩා කිරීමේ දී ඇතිවන ප්‍රමාදය නිසා නැව්වලට දිනකට ඇමෙරිකානු ඩොලර් 50,000 බැගින් ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදුවෙයි. දැනට මුතුරාජවෙල ගබඩාවලින් දිනකට බෙදාහරින ඉන්ධන ප්‍රමාණය දෙස බලන විට ගබඩා කර ඇති ප්‍රමාණය බෙදාහරින්නට මාස 6 ක කාලයක් ගතවේ. සාමාන්‍ය වශයෙන් වැඩිපුර තෙල් බෙදාහැරීම කළ යුත්තේ කොලොන්නාව ගබඩා සංකීර්ණයෙන් වුවත් එය දැන් කෙරෙන්නේ නැත. එසේ නොවන්නේ පෞද්ගලික අංශයේ බවුසර් හිමියන්ට ඉන්ධන ප්‍රවාහනය ලබාදීම සඳහා ප්‍රවාහන කළමනාකරු ඔවුන්ගෙන් අත යට මුදල් ලබා ගන්නා බැවිනි. ඒ තොරතුරු පසුගියදා 'ලංකා ඊ නිව්ස්' අනාවරණය කළේය.

සංස්ථාවේ සභාපතිවරයාට ඉන්ධන ගෙන්වීමේ නිසි ක්‍රමවේදයක් නැතිව ඔහු තෙල් 'හෙජින්' කිරීම නිසා මේ සතිය තුළදී සංස්ථාව ඇමරිකානු ඩොලර් මිලියන 25 ක මුදලක් ස්ටෑන්ඩඩ් චාටර්ඩ් බැංකුවට ගෙවීමට සිදුව තිබෙන අතර, මෙය සංස්ථාවට දරන්නට වන පූර්ණ පාඩුවකි. මේ වනවිටත් සංස්ථාව ඉන්ධන සඳහා ගෙවන්නට ඇති හිඟ මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 700 කි.

අපට වාර්තා වන්නේ මේ සියලු දූෂිත ගනුදෙනු සංස්ථාව භාර ඇමැතිවරයා පවා නොදැනුවත්ව සභාපතිවරයාගේ තනි මතයට සිදුවන බවයි.

## ආහාර පොලක්

**කීස්බරෝ ධම්මසරණ විහාරයේ ළඟදී වැඩ පටන් ගැනීමට නියමිත ධර්මශාලා විහාර මන්දිර ගොඩනැගිලි අරමුදලට ආධාර පිනිස මහා ආහාර පොලක් පැවැත්වීමට කටයුතු යොදා තිබේ .**

ස්ථානය - කීස්බරෝ හි
South Eastern Mesonic Centre
Hutton Road

**2008 නොවැම්බර් 16 වන දා**

වැඩි විස්තර සඳහා විහාරස්ථානයේ
දුරකතන අංකය 03 9769 0872